සමාජය තුළ ලිංගික ශ්‍රමිකයින් සම්බන්ධයෙන් ඇත්තේ එතරම් සුභවාදී ආකල්පයන් නොවේ. මෙම තත්වය තීව්‍ර වීමට, මාධ්‍ය ඔස්සේ බොහෝවිට ලිංගික සේවා සැපයීම සහ ලිංගික ශ්‍රමිකයින් පිළිබඳව මවන චිත්‍රය ද හේතුවකි.

උදාහරණයක් ලෙස, ඔවුන්ව හඳුන්වීමට "ගණිකාව" වැනි යෙදුම් භාවිතයත්, එම සේවා සපයන ස්ථාන හඳුන්වීමට "ගණිකා නිවාස", "ගණිකා මඩම්" වැනි යෙදුම් භාවිතයත් මෙම අසුභවාදී ආකල්ප තවත් වර්ධනය කිරීමට හේතු විය හැක. මන්ද යත්, "ගණිකාව" යන යෙදුම සමඟින් පෙඳුවේ සමාජය තුළ කොන් කරන සුළු, ගර්හාත්මක ආකල්පයන් බැඳී තිබෙන බැවිනි.

1) එසේ නම්, "ගණිකාව" වැනි යෙදුමක් වෙනුවට, "ලිංගික ශ්‍රමිකයින්", "ලිංගික සේවා සපයන්නන්", වැනි විකල්ප යෙදුම් භාවිතයත්, "ගණිකා නිවාස", "ගණිකා මඩම්" වැනි යෙදුම් වෙනුවට "ලිංගික සේවා සපයන ස්ථාන" වැන්නක් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

2) "ගණිකාව, ගණිකාව" වැනි යෙදුම් භාවිතයෙන් ඉවත් කිරීම, එම යෙදුම් සමඟ බැඳී ඇති ගර්හාත්මක සමාජ ආකල්පයන් හේතුවෙන් එම ශ්‍රමිකයින්ට විඳින්නට සිදුවන කොන් කිරීම් අවම කිරීමට පිටුවහලක් වනු ඇතැයි ඔබ නොසිතන්නේ ද?

ලිංගික ශ්‍රමිකයින් කොන් කිරීමට ලක් කරන යෙදුම් භාවිතයෙන් ඉවත් කරමු!